සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

8279

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade	7 ශ්‍රේණිය	ගණිතය	කාලය / நேரம் / Time	පැය 2 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

I කොටස

★ **ප්‍රශ්න අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින්.**

01. හිස් කොටුවට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

$3 : \square = 12 : 20$

02. $(+3)+(-7)$ සුළු කරන්න.

03. ද්විපාර්ශ්වික සමමිතික රූපයක් ලැබෙන සේ මෙම රූපය සම්පූර්ණ කරන්න.



04. 36 යන සංඛ්‍යාව ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස දක්වන්න.

05. දී ඇති ත්‍රිකෝණයේ පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න.



06. මෙහි දක්වා ඇති කෝණය මැන අගය ලියන්න.

එය විශාලත්වය අනුව කුමන වර්ගයේ කෝණයක්ද ?



07. මෙම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකස් කර ලියා දක්වන්න.

0.56, 1.06, 0.056, 0.36

08. සිත්මිගේ නිවසේ සතියකට පරිභෝජනය කරන සහල් ප්‍රමාණය 16 kg 450 g වේ. සෑම දිනකම සමාන ප්‍රමාණය බැගින් සහල් පරිභෝජනය කරයි නම්, දිනකට පරිභෝජනය කරන සහල් ප්‍රමාණය සොයන්න.

09. හිස්තැන් සම්පූර්ණ කරන්න.



10.



රූපසටහනෙහි AB හා CD දිගින් සමාන වේ නම් AB දිග සොයන්න.

11. රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය 15 cm^2 ක් නම් ABCD සමචතුරස්‍රයේ වර්ගඵලය සොයන්න.



12. $20 \div (8 - 3)$ සුළු කරන්න.

13. 

ඉහත දී ඇත්තේ සමාන වෘත්තාකාර හැඩතල තුනක් සහ එවැනි හැඩතලයකින් හරි අඩකි. එම ප්‍රමාණය මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියා එය විෂම භාගයක් ලෙස ද දක්වන්න.

14. පහත වර්ෂවලින් අධික වර්ෂ තෝරා යටින් ඉරක් අඳින්න.

1) 2002 2) 1612 3) 1600 4) 1800

15. භාජනයක $\frac{1}{3}$ ක ද්‍රව ප්‍රමාණයක් පිරී පවතී. එම ද්‍රව ප්‍රමාණය $2l$ $325\ ml$ නම්, භාජනය සම්පූර්ණයෙන් පිරවීමට අවශ්‍ය ද්‍රව ප්‍රමාණය සොයන්න.



16. සරල දාර පමණක් ඇති සංයුක්ත ඝන වස්තුවක මුහුණත් ගණන 7 කි. දාර ගණන 12 කි. එහි ශීර්ෂ ගණන සොයන්න.

17. $2x+3=7$ යන සමීකරණය විසඳීමට ලබාදී ඇති පහත සටහන සම්පූර්ණ කරන්න.



18. රූපයේ දැක්වෙන ඝනක හැඩැති පෙට්ටියේ පැත්තක දිග 4 cm ක් නම් එහි පරිමාව ගණනය කරන්න.



19. 1 : 500 පරිමාණයට අඳින ලද ඉම්මිරිය වේදිකාවක පරිමාණ රූපයෙහි 5cm කින් දැක්වෙන සැබෑ දිග මීටර්වලින් කොපමණද ?

20. i)

.....

ii)



.....

ඉහත සඳහන් ටෙලසාකරණ කුමන වර්ගයේ ටෙසලාකරණයක් දැයි හිස්තැන්වල ලියන්න.

II කොටස

★ **ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
★ **එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් හිමිවේ.**

01. කාටිසීය තලයක් මත ලක්ෂ්‍ය ලකුණු කිරීමට අදාලව ඔබ පන්ති කාමරයේ දී සිදුකළ ක්‍රියාකාරකම සිහිපත් කරන්න.

i) කාටිසීය තලයක් මත A, B, C, D ලක්ෂ්‍ය හතරක ඛණ්ඩාංක ගොඩනැගීමට අදාල පහත වගුව පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල. 03)

ලක්ෂ්‍යය	A	B	C	D
x ඛණ්ඩාංකය	.....	4	5	.....
y ඛණ්ඩාංකය	1	.....	3	.....
ඛණ්ඩාංකය	(1, 1)	(4, 1)	(..... , ...)	(2, 3)

ii) වගුවේ දැක්වෙන ඛණ්ඩාංක ඇසුරින් කාටිසීය තලයක් මත A, B, C, D ලක්ෂ්‍යය ලකුණු කරන්න. (ල. 04)

iii) A, B, C, D හා A ලක්ෂ්‍ය පිළිවෙලින් යා කරන්න. (ල. 01)

iv) ලැබෙන රූපයේ නම ලියන්න. (ල. 01)

v) AC හා BD රේඛා ඇඳ එම රේඛා දෙක ඡේදනය වන ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ලියන්න. (ල. 02)

vi) ABCD ද්විපාර්ශ්වික ලෙස සමමිතික රූපයක් වේද ? (ල. 01)

02.



	C
දුම්රියෙන්	10
බසයෙන්	20

ඉහත දක්වා ඇත්තේ A, B හා C නම් ආයතන තුනක සේවකයින් කාර්යාලයට පැමිණෙන ආකාරය දැක්වෙන බහුතීර ප්‍රස්තාරයකි.

i) දෙන ලද තොරතුරු අනුව බහුතීර ප්‍රස්තාරය පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න. (ල. 03)

ii) ආයතන තුනේම දුම්රියෙන් පැමිණෙන සේවක සංඛ්‍යාව කොපමණද ? (ල. 02)

iii) ආයතන තුනේම වැඩි පිරිසක් පැමිණෙන්නේ දුම්රියෙන් ද ? බසයෙන්ද ? (ල. 02)

iv) A ආයතනයට බසයෙන් පැමිණෙන සේවක සංඛ්‍යාව B ආයතනයට බසයෙන් පැමිණෙන සේවක සංඛ්‍යාවට වඩා කොපමණ වැඩිද ? (ල. 01)

v) ආයතන තුනේම බසයෙන් පැමිණෙන සේවක සංඛ්‍යාව, දුම්රියෙන් හා බසයෙන් පැමිණෙන මුළු සේවක සංඛ්‍යාවෙන් කවර භාගයක්ද ? (ල. 02)

vi) B ආයතනයේ දුම්රියෙන් පැමිණෙන සේවකයින් 8 දෙනෙකු බස්රියෙන් පැමිණීමට පටන් ගත්තේ නම්, ආයතන තුනෙහිම මුළු සේවක සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක් බසයෙන් පැමිණේද ? (ල. 02)

03. (a) i) අවයව 5 ක් පමණක් ඇති කුලකයක් හඳුනාගත හැකි පොදු ලක්ෂණ අනුව ලියා එය P ලෙස නම් කරන්න. (ල. 02)

ii) $A = \{2, 3, 5, 7, 11, 13\}$ මෙම කුලකය හඳුනාගත හැකි පොදු ලක්ෂණ මගින් ලියා දක්වන්න. (ල. 02)

iii) B = {KOLLUPITIYA යන වචනයේ අකුරු}

B කුලකය වෙන්රූප සටහනක දක්වන්න. එහි අවයව සංඛ්‍යාව කීයද ? (ල. 02)

(b) i) ස්ථිරවම සිදු නොවන සිදුවීමක් හා ස්ථිරවම සිදුවන සිදුවීමක් සඳහා උදාහරණයක් බැගින් ලියන්න. (ල. 02)

ii) පරීක්ෂණයකදී යොදාගත හැකි සාධාරණ වස්තු 2 ක් නම් කරන්න. (ල. 02)

iii) 1 සිට 4 තෙක් අංකනය කරන ලද සවිධි චතුස්තලාකාර කැටයක් මේසයක් මත පෙරළීමේදී මේසය මත ස්පර්ශ වන පෘෂ්ඨයේ අංකය සටහන් කරගන්නා ලදී. මෙම පරීක්ෂණයට අදාල ප්‍රතිඵල සියල්ල ලියා දක්වන්න. (ල. 02)

---

04. (a) cm/ mm පරිමාණය සහිත සරල දාරය හා කවකටුව භාවිතයෙන් පමණක් පහත නිර්මාණ සිදු කරන්න.

i) දිග 5cm ක් වූ රේඛා ඛණ්ඩයක් ඇඳ එය AB ලෙස නම් කරන්න. (ල. 01)

ii) AB රේඛාව එක් පාදයක් වන සේ ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න. (ල. 02)

iii) B ලක්ෂ්‍යය කේන්ද්‍රය ලෙස ගෙන AB දුර, අරය වන වෘත්තයක් අඳින්න. (ල. 01)

iv) එම වෘත්තය මත D, E, F, G ලක්ෂ්‍ය පිළිවෙලින් ලකුණු කරමින් ACDEFG සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න. (ල. 02)

(b) දී ඇති තල රූපය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i) OAB පාද අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක්ද ? (ල. 01)

ii) සමද්විපාද ත්‍රිකෝණයක් නම් කරන්න. (ල. 01)

iii) සෘජුකෝණී ත්‍රිකෝණයක් නම් කරන්න. (ල. 01)

iv) OBCD තලරූපය හැඳින්වීමට සුදුසුතම නම කුමක්ද ? (ල. 01)

v) OBDEFA තලරූපය උත්තල බහු අස්‍රයක් වේද ? අවතල බහු අස්‍රයක් වේද ? පිළිතුරට හේතු දක්වන්න. (ල. 02)

---

05. (a) අරුණ, ගණිතය ඇගයීමකදී ලකුණු 25 න් 18 ක් ද, විද්‍යාව ඇගයීමකදී ලකුණු 20 න් 13 ක් ද ලබාගත්තේය.

i) එක් එක් විෂය සඳහා ලබාගත් ලකුණු, මුළු ලකුණු සංඛ්‍යාවේ භාගයක් ලෙස දක්වන්න. (ල. 02)

ii) ඔහු ඒ ඒ විෂය සඳහා ලබාගත් ලකුණුවල ප්‍රතිශතයන් සොයා, වැඩි සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත්තේ කුමන විෂයටදැයි සොයන්න. (ල. 04)

(b) A හා B සීනි පාර්සල් දෙකකි. ඒවායේ ස්කන්ධයන් දක්වා ඇත.



i) B පාර්සලයේ ඇති සීනි, A පාර්සලයට දැමූවිට එහි ඇති සීනි ප්‍රමාණය කිලෝග්‍රෑම් කොපමණද ? (ල. 03)

ii) පසුව එම සීනි වලින් $2\frac{5}{6}$ Kg ක් ප්‍රයෝජනයට ගත්තේ නම්, ඉතිරි සීනි ප්‍රමාණය කොපමණද ? (ල. 03)

---

06. (a) වෙළඳසලකට ගිය සමන්, රුපියල් x වටිනාකමින් යුත් භාණ්ඩ මිලදී ගත් අතර අනුර, එමෙන් දෙගුණයකට වඩා රුපියල් 50 ක් අඩු වටිනාකමින් යුත් භාණ්ඩ මිලට ගත්තේය.

i) අනුර භාණ්ඩ මිලදී ගැනීමට වැයකළ මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ල. 02)

ii) දෙදෙනාම භාණ්ඩ මිලදී ගැනීමට වැයකළ මුළු මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ල. 02)

iii) සමන් වැයකළ මුදල රු. 500 ක් නම් අනුර වැයකළ මුදල සොයන්න. (ල. 02)

iv) සමන් හා අනුර වැයකළ මුදල් අතර අනුපාතය ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 02)

(b) i) $5x - 30 = 10$ සමීකරණය විසඳන්න. (ල. 02)

ii) $a = 2$ නම් $3a^4$ හි අගය සොයන්න. (ල. 02)

---

07. (a) රූපයේ දැක්වෙන ගෙමිදුලෙහි දක්වා ඇති මිනුම් අනුව,



i) DC දිග සොයන්න. (ල. 01)

ii) ගෙමිදුලෙහි පරිමිතිය සොයන්න. (ල. 02)

iii) ගෙමිදුලෙහි වර්ගඵලය සොයන්න. (ල. 03)

(b) 1 : 200 පරිමාණයට අනුව ගෙමිදුලෙහි පරිමාණ රූපයක් ඇඳීමට අදහස් කරයි.

i) පරිමාණ රූපයේ 1 cm ක දිගකින් සැබෑ රූපයේ දැක්වෙන දිග මීටර් කීයද ? (ල. 02)

ii) ඒ අනුව පරිමාණ රූපයේ AB දැක්වීමට යොදා ගන්නා දිග සෙන්ටිමීටර් කීයද ? (ල. 01)

iii) 1 : 200 පරිමාණයට අනුව ගෙමිදුලෙහි පරිමාණ රූපය අඳින්න. (ල. 03)

අවසාන වාර පරීක්ෂණය -2023(2024)

7 ශ්‍රේණිය -ගණිතය පිළිතුරු පත්‍රය

1 කොටස					
1) 5		**02**	11) 15 cm^2 x 4 = 60 cm^2	**01** **01**	**02**
2) (-4)		**02**	12) 20 ÷5 = 4	**01** **01**	**02**
3) නිවැරදි රූපසටහනට		**02**	13) $3\frac{1}{2}, \frac{7}{2}$	**01+01**	**02**
4) $2 \times 2 \times 3 \times 3$		**02**	14) ii) 1612 iii) 1600	**01+01**	**02**
5) $5x + 5x + 2x + 3$ $= 12x + 3$	**01** **01**	**02**	15) *l* *ml* 2 325 × 3 6 975	**01** **01**	**02**
6) 25^0 සුළු කෝණය	**01+01**	**02**	16) V + F = E + 2 V + 7 = 12 + 2 V = 14 - 7 = 7	 **01** **01**	**02**
7) 0.056 , 0.36 , 0.56 , 1.06		**02**	17) වමත් පස x 2 දකුණත් පස - 3	**01** **01**	**02**
8) 16 kg 450 g ÷ 7 = 2 kg 350 g හෝ = 2350 g	**01** **01** **හෝ 01**	**02**	18) 4 cm x 4 cm x 4 cm 16 cm^3	**01** **01**	**02**
9) 23/100 23%	**01** **01**	**02**	19) 1 cm ⟶ 500 cm 1 cm ⟶ 5 m 5 cm ⟶ 5 m x 5 = 25 m	 **01** **01**	**02**
10) m cm 19 26 7 14 12 12 AB = 6 m 6cm	 **01** **01**	 **02**	20) i) අර්ධ ශුද්ධ ටෙසලාකරණය ii) ශුද්ධ ටෙසලාකරණය	**01** **01**	**02**
II කොටස					
1) i) A ⟶ 1 B ⟶ 1 C ⟶ (5,3) D ⟶ $x = 2$ $y = 3$ ii) නිවැරදි ලක්ෂ්‍ය 4ට iii) සම්පූර්ණ කරන ලද රූපසටහන iv) සමාන්තරාස්‍රය v) (3,2) vi) නැත		 **03** **04** **01** **01** **02** **01**			

2) i) C සම්පූර්ණ කිරීම **03**

ii) 15+20+10 = 45 **01+01** **02**

iii) දුම්රියෙන් = 45 **01**

බසයෙන් = 55 **හෝ**

45 < 55 **01**

බසයෙන් **01** **02**

iv) A ⟶ 25

B ⟶ 10

25 – 10 = 15 **01**

v) එකතුව = 45+55 = 100 **01**

බසයෙන් = 55/100 **01** **02**

vi) $\frac{63}{100}$ x 100% = 63% **01+01** **02**

3) a) i) නිවැරදි පිළිතුරට **02**

ii) A = { 1ත් 14ත් අතර ප්‍රථමක සංඛ්‍යා } **02**

iii)



01

අවයව සංඛ්‍යාව = 9 **01** **02**

b) i) නිවැරදි පිළිතුරු දෙකකට **02**

ii) සමබර කාසිය **01**

සමබර දාදු කැටය **01** **02**

iii) {1,2,3,4} **02**

4) a) i) AB නිර්මාණය කිරීම **01**

ii) සමපාද ත්‍රිකෝණය නිර්මාණය කිරීම **02**

iii) වෘත්තය නිර්මාණය කිරීම **01**

iv) ACDEFG සවිධි ෂඩාස්‍රය නිර්මාණය කිරීම **02**

b) i) සමපාද ත්‍රිකෝණය **01**

ii) OBD හෝ BDC **01**

iii) ADB **01**

iv) රොම්බසය **01**

v) අවතල **01**

නිවැරදි හේතුවට **01** **02**

5) a) i) ගණිතය = 18/25 **01**

විද්‍යාව = 13/20 **01** **02**

ii) $\frac{\text{ගණිතය}}{25}$ x 100% = 72% **01**

$\frac{\text{විද්‍යාව}}{20}$ x 100% = 65% **01**

72% > 65% **01**

ගණිතය **01** **04**

5) b) i) 3 1/3 + 1 2/5

$= \frac{10}{3} + \frac{7}{5} = \frac{50+21}{15}$ **01**

$= \frac{71}{15}$ **01**

= 4 11/15 kg **01** **03**

ii) 4 11/15 - 2 5/6

$= \frac{71}{15} - \frac{17}{6}$ **01**

$= \frac{142 - 85}{30} = \frac{57}{30}$ **01**

= 1 27/30 kg **හෝ** 1 9/10 kg **01** **03**

6)

a) i) රු. (2x – 50) **02**

ii) රු. (x+2x-50) = රු.(3x-50) **02**

iii) රු. (2x500-50) = රු.(1000-50) **01**

= රු. 950 **01** **02**

iv) සමන් අනුර

500 : 950 **01**

10 : 19 **01** **02**

b) i) 5x-30+30 = 10+30

5x = 40 **01**

x = 8 **01** **02**

ii) $3x2^4$ = 3x16 **01**

= 48 **01** **02**

7)

a) i) DC = 4m **01**

ii)

10m+8m+6m+4m+4m+12m **01**

හෝ **හෝ**

2x10m + 2x12m **01**

= 44m **01** **02**

iii) 10m x 8m + 4m x 4m **01+01**

හෝ **හෝ**

12m x 4m + 8m x 6m **01+01**

= 96 m^2 **01** **03**

b) i) 1cm ⟶ 200cm = 2m **01+01** **02**

ii) 12 ÷ 2 = 6 cm **01**

iii) නිවැරදි පරිමාණ රූපයට **03**